පැමිණිලි පාර්ශවය : ජේ. රණසිංහ මිය.
නො 54/2, වදුරඹ උතුර,
වදුරඹ,
ගාල්ල.

වගඋත්තර පාර්ශවය 01 විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

02 ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඇල්පිටිය.

03 ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බද්දේගම.

**<u>පැමිණිලි අංකය : එච්ආර්සී/4605/15</u>**

පැමිණිලිකාරිය සිය පැමිණිල්ල මගින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර සිටින්නේ පැමිණිලිකාරියගේ විවාහක ස්වාමිපුරුෂයා වන කොඩිතුවක්කු අන්ද්‍රියස් ජයසේකර යන අය මිය ගොස් ඇති බවත් පැමිණිලිකාරියට හිමි වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප් ලබා නොදෙන බවත්ය. ඒ අනුව වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප ලබා ගැනීම පැමිණිලිකාරිය අපේක්ෂා කර සිටී.

**වගඋත්තරකරුගේ ස්ථාවරය**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ දී පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර ප්‍රාදේශීය ලේකම් ඇල්පිටිය විසින් සිය ස්ථාවරය මෙසේ ඉදිරිපත් කර ඇත.




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අංක 54/02, වදුරඹ උතුර, වදුරඹ, ගාල්ල යන ලිපිනයෙහි පදිංචි ජොසලින් රණසිංහ මිය එනම් පැමිණිලිකාරිය විසින් සිය වැන්දඹු විශ්‍රාම වැටුප් ලබා නොදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කර ඇත. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණයේ දී පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයා ලෙස සැලකෙන අංක 01-95238 යටතේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබමින් සිටියදී වර්ෂ 1993-03-03 වන දින මිය ගොස් ඇති කොඩිතුවක්කු අන්දිරිස් අප්පුහාමි යන අය හා පැමිණිලිකාරිය සමග විවාහ වී සිටියා යැයි පවසන කොඩිතුවක්කු අන්ද්‍රයස් ජයසේකර, අන්ද්‍රයස් කොඩිතුවක්කු ජයසේකර යන අය පිළිබඳ උප්පැන්න සහතිකය, දරුවන්ගේ උප්පැන්න හා පත්වීම් හා නාම ලේඛන ඇසුරින් පරීක්ෂණයක් පවත්වා මෙම නම් වලින් ඉදිරිපත්ව සිටින්නේ එකම පුද්ගලයෙකු ද යන්න සම්බන්ධයෙන් පහත නිර්දේශ ඉදිරිපත් කරමි.

01 කොඩිතුවක්කු අන්දිරිස් අප්පුහාමි, කොඩිතුවක්කු අන්ද්‍රයස් ජයසේකර, කොඩිතුවක්කු අන්ද්‍රයස් අප්පුහාමි යන නම් වලින් පෙනී සිටි පුද්ගලයන්ගේ උප්පැන්න සහතිකයක් ඉදිරිපත් කිරීමට පැමිණිලි පාර්ශවය අපොහොසත් වී ඇත.

02 විවාහ සහතිකය හා දරුවන්ගේ උප්පැන්න සහතික වල අන්ද්‍රයස් කොඩිතුවක්කු ජයසේකර යන නාමය භාවිතා කොට ඇත.

03 විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ඇති සියලුම ලිපි ලේඛන වල නම සඳහන්ව ඇත්තේ කොඩිතුවක්කු අන්දිරිස් අප්පුහාමි යනුවෙනි.

04 ඡන්දහිමි නාම ලේඛනවල නම සඳහන් වී ඇත්තේ අන්ද්‍රයස් ජයසේකර යනුවෙනි.

05 කොඩිතුවක්කු අන්ද්‍රයස් ජයසේකර යනුවෙන් නම භාවිතා කළ පුද්ගලයා පදිංචිව සිටි 94 සී, වතුරවිල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉඩම ජනාධිපතිවරයා විසින් දෙනු ලබන ප්‍රධාන පත්‍රයේ ඉඩම් අයිතිකරු ලෙස කොඩිතුවක්කු අන්ද්‍රයස් අප්පුහාමි යන නාමය සටහන් වී ඇත. ඒ අනුව කොඩිතුවක්කු අන්දිරිස් අප්පුහාමි, කොඩිතුවක්කු අන්ද්‍රයස් අප්පුහාමි යනුවෙන් නම් දෙකක් කොඩිතුවක්කු අන්ද්‍රයස් ජයසේකර යනුවෙන් පෙනී සිටි පුද්ගලයා භාවිතා කොට ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත කරුණු සලකා බලා කොඩිතුවක්කු අන්දිරිස් අප්පුහාමි මහතාගේ 82/229011 වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිකම පැමිණිලිකරුට ලබාදීම සම්බන්ධයෙන් විරෝධතාවක් නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

එසේම වගඋත්තරකාර ප්‍රාදේශීය ලේකම්, බද්දේගම විසින් සිය ලිඛිත දේශන මගින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ කොඩිතුවක්කු අන්දිරිස් අප්පුහාමි, කොඩිතුවක්කු අන්ද්‍රයස් ජයසේකර හා කොඩිතුවක්කු අන්ද්‍රයස් ජයසේකර අප්පුහාමි යන අය එකම පුද්ගලයෙකු වන බවයි. එසේම කොඩිතුවක්කු අන්ද්‍රයස් ජයසේකර යන අයට නම් 02 ක් භාවිතා වූ බවට වදුරඹ ශ්‍රී සුභද්දාරාම විහාරාධිපති පූජ්‍ය ගෝණලගොඩ පඤ්ඤාජෝති නායක හිමියන් විසින් ද සනාථ කොට ඇති බව වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

**නිරීක්ෂණ**

මෙම පැමිණිල්ලෙහි 02 හා 03 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයාගේ භාවිත නම් 03 න් හඳුන්වන්නේ එකම අයෙකු බව සනාථ කර ගැනීම සඳහා වෙන වෙනම විමර්ශන පවත්වා ඇති බව නිරීක්ෂණය වේ. එම විමර්ශන සහ අදාල ලේඛනගත සාක්ෂි කෙරෙහි අවධානය යොමු කිරීමේ දී කොඩිතුවක්කු අන්ද්‍රයස් ජයසේකර, කොඩිතුවක්කු අන්ද්‍රයස් අප්පුහාමි සහ කොඩිතුවක්කු අන්දිරිස් අප්පුහාමි යන නම් වලින් හඳුන්වන්නේ එකම පුද්ගලයා බව සනාථ වේ. ඒ අනුව පැමිණිලිකාරියට වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිකමේ නීත්‍යානුකූල හිමිකම ලැබිය යුතු බව මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

**නිර්දේශය**

ඒ අනුව සියලු කරුණු කාරණාවන් කෙරෙහි මානව හිමිකම් කොමිෂන් සභාවෙහි අවධානය යොමු කිරීමෙන් අනතුරුව වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදය යටතේ හඳුන්වා දී ඇති මූලික අයිතිවාසිකමක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදිත සර්ව සාධාරණයේ අයිතිවාසිකම (නීතිය පසිඳලීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම. නීතියේ රැකවරණයද සර්ව සාධාරණ වියයුත්තේය) යන මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට නිර්දේශ කරන අතර.

01 අංක 01-95238 යටතේ වැන්දඹු විශ්‍රාම වැටුප් පැමිණිලිකරුට නීත්‍යානුකූල ලෙස හිමිගැන්විය යුතු බවත්

02 අදාල වැන්දඹු විශ්‍රාම වැටුප් කඩිනමින් සකස් කළයුතු බවත්

03 විශ්‍රාම ලද දින සිට පැමිණිලිකාරියට හිමිවියයුතු හිඟ විශ්‍රාම වැටුප් ගෙවියයුතු බවත් වගඋත්තරකරු වෙත නිර්දේශ කර සිටිමු.

2022-02- 21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හෙ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Kar
Commissione
Human Rights Commissio

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka